**ශීර්ෂය 108 - තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 108 - තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 543.73 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 380.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 163.57 ක් හෙවත් සියයට 30.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 128.43 | 122.64 | 5.79 | 4.5 |
| මූලධන | 415.30 | 257.52 | 157.78 | 37.99 |
| **එකතුව** | **543.73** | **380.16** | **163.57** | **30.08** |

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 5.20 | 2.00 | 2.68 | 26.00 | 11.39 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0349/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 18.35 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 12.54 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. මිලියන |
| 6000/0000/00/0016/0079/000 | 12.31 |
| 6000/0000/00/0018/0016/000 | 0.23 |
| **එකතුව** | **12.54** |

**2.5 විගණන නිරීක්ෂණය**

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන පොත්පත් පවත්වාගෙන යාම**

1978 දෙසැම්බර් 19 දිනැති 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.මිලියන 43 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. ප්‍රසම්පාදන කටයුතු වර්ෂය අවසානයේ සිදු කිරීම නිසා වර්ෂය අවසානයට පෙර මිලදී ගැනීමට නියමිතව තිබූ වාහනය ආනයනය කිරීමට නොහැකි වීම ඉතිරිවීමට හේතු වී තිබුණි.

(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් හා වර්ෂය තුළ නිමකළ යුතු කාර්යයන් කාර්යක්ෂමව සිදු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 10 ක් සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව ඉතිරිය රු. 95,260,766 ක් විය. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 07 සිට සියයට 95 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2.2 අනිවාර්ය ඉතිරි කිරීම්**

------------------------

(අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන වියදම් දැරීම සඳහා බලය දීම 2016 අයවැය සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයෙහි (2) ඡේදය ප්‍රකාරව ඉන්ධන ප්‍රතිපාදනවලින් සියයට 15 ක් එනම් රු. 1,479,000 ක අනිවාර්ය ඉතිරි කිරීම් කළ යුතු වුවත්, එසේ නොකර වෙනත් වැය විෂයයන්වලින් ඉතිරි කිරීම් සිදු කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛය ප්‍රකාර ප්‍රවාහන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවලින් සියයට 10 ක එනම් රු. 400,000 අනිවාර්ය ඉතිරි කිරීම් කළ යුතු වුවද ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/RDS/108/1/2/1 දරන 2016 ජූලි 25 දිනැති ලිපියට අනුව ප්‍රවාහන වියදම් වැය විෂයයෙන් අවුරා තැබිය යුතු ප්‍රමාණය වෙනත් වැය විෂයයකින් අවුරා තැබීමට බලය ලබා දී තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු. 17,885,954.74 ක මුදල් ශේෂය භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණද, එම ශේෂය අග්‍රිම ගිණුමේ බැර කිරීම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබූ රු. 460,000 ක අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබූ අතර ඉන් රු. 450,000 ක් 2017 මැයි 09 දින වන විටද පියවා නොතිබුණි.

**3.4 බේරුම් නොකළ බැරකම්**

------------------------------

**3.4.1 ඉතිරිය ඉක්මවා බැරකම්වලට බැඳීම**

-----------------------------------------

මු.රෙ.94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු නමුත් වැය විෂයයන් 11 කට ආදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 1,458,077 ක බැරකම් වලට බැඳීම් ඇති කරගෙන තිබූ අවස්ථාවන් විය.

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------------

මෙම අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන මුදල් අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරකට ලක් වී නඩු භාණ්ඩයක් ලෙස ගල්කිස්ස උසාවි භූමියේ ගාල්කර තිබුණි. මේ හේතුවෙන් එම වාහනය පවරා ගැනීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2016 ජූලි 26 දින මා වෙත දන්වා තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 104(3) | අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව පිළියෙල කර යුතු වුවද, අවස්ථා දෙකකදී එසේ කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 104(4) | අලාභ හානියක් සිදු වී මාස 03ක් ඇතුළත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවද ඒ අනුව කටයුතු නොකල අවස්ථා 13 ක් විය. |

**3.7 අවිධිමත් ගනුදෙනු**

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------------------

**(අ) මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම**

-----------------------------------------------

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින වකුෆ් මණ්ඩලය, වකුෆ් අධිකරණය, පර්යේෂණ මධ්‍යස්ථානය හා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා පුස්ථකාලය එකම ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීම සඳහා 1995 ජනවාරි 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ගොඩනැගිල්ල රු. මිලියන 286.9 කට ඉදිකිරීමට හා ඉංජිනේරු සංස්ථාවේ උපදේශකත්වය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මගින් ඉදිකරවා ගැනීමට 2006 මැයි 24 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එම අනුමැතියේ සිට මේ වන විට වසර 10 කට අධික කාලයක් ගත වී තිබුණද, ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි.

මේ සඳහා විස්තරාත්මක සැලසුම් සහ ප්‍රමාණ පත්‍ර සැකසීම අවසන් නොකිරීම, සැලසුම් වෙනස් කිරීම, කාලගුණ විපර්යාස හා මුදල් නිදහස් කිරීම් සීමා කිරීම සිදු කිරීම ආදිය බලපා තිබුණි.

(ii) මෙහිදී ගොඩනැගිල්ල බිම් මහල හා මහල් 9 කින් නිමකිරීමට යෝජිතව තිබුණි. 2008 වර්ෂයේදී මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 596 දක්වා සංශෝධනය කර තිබුණද මේ සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණ අතර 2008 ජූලි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුකූලව පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කළ යුතු බවට තීරණය කර තිබුණි.

(iii) එසේ තිබියදී රු. මිලියන 938 ක සංශෝධිත ඇස්තමේන්තුවක් 2015 ඔක්තෝබර් 21 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා 2015 නොවැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය වූයේ 2008 වර්ෂයේදි තීරණය කරන ලද ඇස්තමේන්තු අගය වූ රු. මිලියන 596 ඇතුලත මෙම ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් වන විට නිමකරන ලෙසය. එසේ වුවද 2008 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය රු. මිලියන 596 කට සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන නොතිබුණි.

(iv) රු. මිලියන 596 ඇස්තමේන්තුවට මුළු ගොඩනැගිල්ලම නිමකිරීමට නොහැකි බවට කරුණු දක්වා එම මුදලට බිම්මහල ඇතුළුව මහල් 04 ක් පමණක් නිමකර පිටත නිමවුම් අවසන් කිරීමට නැවත 2016 මාර්තු 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. මෙහිදී ඉදිකිරීම අදියර I, II හා III වශයෙන් අදියර 03 ක් යටතේ සිදුකර තට්ටු 10 දක්වා කොන්ක්‍රීට් වැඩ අවසන් කර තිබුණද එහි මහල 06 ක වැඩ නිමකර නොතිබුණි.

(v) 2006 වර්ෂයේදී සැලසුම් කළ පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීම සිදුකලේ නම් රු. මිලියන 286.9 ක මුදලකින් නිම කිරීමට හැකියාව තිබුණි. 2016 වර්ෂය වන විට මුළු පිරිවැය රු. මිලියන 938 ක් ලෙස ගණනය කර තිබුණ අතර එය සියයට 228 ක වැඩිවීමක් විය.

(vi) කොළඹ නගරයේ ආර්ථික වටිනාකම ඉතාමත් ඉහල බිම් ප්‍රදේශයක ස්ථාපිත කර ඇති මෙම ගොඩනැගිල්ලේ ඉතිරි මහල් 06 හි ඉදිකිරීම් කටයුතු නිම කර ආර්ථිකයට ප්‍රයෝජනවත් හා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(vii) 2017 ජුනි 14 දින වනවිට දෙපාර්තමේන්තුව මගින් සකස්කර විගණනයට ඉදිරිපත් කරන ලද ලැයිස්තුව අනුව අදියර I පයිලිං සඳහා රු. 45,323,071 ක්, අදියර II කොන්ක්‍රීට් සැකිල්ල සඳහා රු. 183,832,430 ක් හා අදියර III සඳහා රු. 82,994,471 ක් වශයෙන් ගෙවා තිබූ මුළු මුදල රු. 312,149,973 ක් විය.

(viii) **III අදියර**

-----------

* III අදියර සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණ අතර කාර්යසාධන බැඳුම්කර ඉදිරිපත් කර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

* උපදේශක ආයතනය විසින් ප්‍රමාණ පත්‍ර 2016 ජූලි 21 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණ අතර එය ප්‍රමාද වී 2016 ජූලි 22 දින ඉදිරිපත් කර තිබුණි.

* එම ප්‍රමාණ පත්‍ර සඳහා නිවාස හා ඉදිකිරීමේ අමාත්‍යාශයේ ස්ථාවර මිල කමිටුවේ අනුමැතිය 2017 ජුලි 19 දින වන විටත් ලැබී නොතිබුණි.

* III අදියරෙහි වැඩ තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සඳහා ප්‍රතිපාදන ලබාගැනීමේදී ඒ වන විට ගෙවා තිබූ මුළු වටිනාකම රු. මිලියන 300.5 ක් බවත් තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍යතාවය රු. මිලියන 295.5 ක් බවත් පෙන්වා දී 2016 වර්ෂය සඳහා රු. මිලියන 295.5 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එසේ වුවද මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව ඒ වනවිට ගෙවා තිබූ වටිනාකම රු. මිලියන 312 ක් වූයෙන් රු. මිලියන 11 ක ප්‍රතිපාදන වැඩිපුර ලබාගෙන එයින් රු. 203,103,599 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

* ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමේදී සැලසුම් නොකරන ලද අංශ 02 ක් හා කාමර 03 ක් වැඩ නිමකරන ලද මහල් හතර තුළ ස්ථාපිත කර තිබුණි.

**(ආ) කැප්පටිපොල මාවත C-12 දරන ස්ථානයේ පිහිටි අමාත්‍යවරයාගේ නිල නිවස අළුත්වැඩියා කිරීම**

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ප්‍රසම්පාදනය 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ හා ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි. මේ සඳහා පරිපූරක ඇස්තමේන්තු දෙකක් මගින් රු. 9,277,808 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

(ii) නිල නිවස අළුත්වැඩියා කිරීම 2016 මාර්තු 30 දින රු. 8,851,029 කට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. පැවරීම සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණයක් ගෙන නොතිබුණි.

(iii) අළුත්වැඩියා කළ යුතු කොටස් හා ඇස්තමේන්තුව වරින් වර ලබාදෙන ලද උපදෙස් අනුව වෙනස් කිරීම් හා ඇස්තමේන්තුවට පිටතින් හා ඇස්තමේන්තු කරන ලද වැඩ කොටස් සිදු නොකිරීම් වැනි දෑ සිදුකර තිබුණි.

(iv) 2016 මැයි 28 දින අමතර වැඩ සඳහා රු. 3,459,414 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ඊට අමතරව 2016 නොවැම්බර් 24 දින ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවෙන් රු. 1,164,135 ක් වටිනා වැඩ අඩුකර තිබුණි. නැවත 2017 පෙබරවාරි 22 අතිරේක වැඩ සඳහා තවත් රු. 1,690,179 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි.

තවද වර්ග අඩි 255 ක Gypsum board සවිකිරීම සඳහා රු. 138,150 ක් වැයකර තිබුණි. මෙසේ සවි කරන ලද Gypsum board ගලවා නැවත පෙර පැවති Arch සවිකිරීමට තීරණය කර තිබුණි. තවද නවීකරණයට පෙර නිල නිවසේ පැවති ටයිල් පැරණි ඒවා නොවන බවද වාර්තා කර තිබුණි

(v) කළවැඩ සඳහා මුදල් ගෙවීමේදී ස්වාධීන වූ සුදුසුකම් ලත් පාර්ශවයකගේ නිර්දේශ අනුව සිදුකළ වුවත් එම කාර්යයද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණි.

(vi) 2016 අප්‍රේල් 06 දින නිල නිවාසයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ඉටුකිරීම පිළිබඳව අධීක්ෂණය හා පසු විපරම් කිරීම සඳහා අමාත්‍යාංශ කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව තුළ සුදුසුකම් ලත් පුද්ගලයින් සිටියදී කළවැඩ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.

**(ඇ) නියෝජ්‍ය අමාත්‍යවරයා සඳහා නව මෝටර් රථයක් මිලදී ගැනීම**

**---------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 අගෝස්තු 03 දින හා 2016 අගෝස්තු 05 දින නියෝජ්‍ය අමාත්‍යවරයාට අවශ්‍ය වාහනයේ පිළිවිතර, වර්ගය හා මාදිලිය කුමක්ද යන්න දන්වා තිබුණ අතර මෙම වාහනය මිලදී ගැනීම සඳහා සීමිත මිල ගණන් 2016 සැප්තැම්බර් 09 දින ආයතන 06 කින් කැඳවා තිබුණි. එහිදී ආයතන 03 ක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි.

(ii) 2016 ඔක්තෝබර් 07 දිනැති තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අනුව මූලික ඇගයීමේදී ආයතන 02 ක් හා අනෙක් ආයතනය දෙවැනි අදියරේදී ප්‍රතික්ෂේප කර නැවත ප්‍රසම්පාදනය සිදුකළ යුතු බවට තීරණය කර තිබුණි.

එසේ වුවද 2016 ඔක්තෝබර් 10 දින ප්‍රධාන ගණකාධිකාරී විසින් නැවත මිල කැඳවීම ඵල රහිත බව දන්වා මූලික ඇගයීමේදී ප්‍රතික්ෂේප කර තිබූ ආයතන දෙකෙහි පිළිවිතර පරීක්ෂා කර නිර්දේශ ලබාදෙන ලෙස ඇගයීම් කමිටුවේ සභාපතිවරයා වෙත දන්වා තිබුණි.

මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවට හිමි බලතල අනුව එම මිල ගණන් නැවත ඇගයීමට ලක්කර නිර්දේශ ලබාගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කළ බව දන්වා ඇතත් එවැනි තීරණයක් නොවීය.

(iii) ඒ සඳහා නැවත තාක්ෂණික ඇගයීම් කමිටුව 2016 ඔක්තෝබර් 14 දින රැස්වී එම ආයතන දෙකෙහි පිළිවිතර සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දී තිබුණි. එම තීරණයට අනුව නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අවශතාවයට ගැලපෙන වාහනය මූලික ඇගයීමේදී ප්‍රතික්ෂේප කරන ලද එක් සමාගමකින් වාහනයක් රු. 42,655,000 ක මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 14 | - |
| තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| ද්වීතික මට්ටම | 61 | 41 | 20 |
| ප්‍රාථමික මට්ටම | 31 | 28 | 03 |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 03 | 01 |
| | **114** | **88** | **26** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පැවති පුරප්පාඩු 26 බඳවා ගැනීමේ හෝ සංශෝධනයන් සිදුකර නොතිබුණි.